# සුරාබදු ආඥාපනත

## අංක 04/2018 දරන සුරාබදු නිවේදනය

## සුරාබදු නිවේදන අංක 666 හි දැක්වෙන කොන්දේසි සංශෝධනය

කලින් කලට සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් 2018 ජනවාරි මස 10 දිනැති අංක 2053/26 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 02/2018 දරන සුරාබදු නිවේදනයෙන් සංශෝධිත 1979 දෙසැම්බර් මස 31 දිනැති අංක 69/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 666 දරන සුරාබදු නිවේදනයෙහි උපලේඛනය,

(1) 5 වැනි ඡේදයේ (v) උප ඡේදය පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත දැක්වෙන උප ඡේදය ආදේශ කිරීම,

"(v) වයස අවුරුදු 18 ට අඩු පිරිමි හා කොයි වයස වුවත් ගැහැණු, එසේ වුවද, සුරාබදු කොමසාරිස් විසින් ඒ කාර්යය සඳහා විශේෂයෙන්ම අනුමත කරන ලද බලපත්‍ර ලත් ස්ථාන වල, වයසින් අවුරුදු දහඅටකට වැඩි ගැහැණු, හෝටල් සේවිකාවන් වශයෙන් පමණක් සේවයේ යෙදවීමට සුරාබදු කොමසාරිස් විසින් සිය අභිමතය පරිදි ඉඩදිය හැකිය;"

(2) 11 වන ඡේදයෙහි (ඇ) උප ඡේදයට ඉක්බිතිවම එහි (ඇ) උප ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු අළුත් උප ඡේදය එකතු කිරීම,

"(ඇ) තැබෑරුමක් ඇතුළත දී කිසිම ස්ත්‍රියකට; හෝ"

මඟින් සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි 18 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.